RECEIVED
08 NOV 2011


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1730/27 - 2011 නොවැම්බර් 05 වැනි සෙනසුරාදා - 2011.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

නියෝග අංක : 17.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, අසුරන්නකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත සඳහන් කර ඇති සූචක නාමයන්ගෙන් (generic names) හැඳින්වෙන ඕනෑම සන්නම් නාමයක් යටතේ අලෙවි කරනු ලබන සිමෙන්ති කිලෝ ග්‍රෑම් 50 ක් බරැති ඇසුරුමක් පහත දක්වා ඇති උපරිම සිල්ලර මිලට වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *සූචක නාමය* | *SLS No.* | *උපරිම සිල්ලර මිල (කි.ග්‍රෑ. 50 ඇසුරුමක් සඳහා) රු. ශත* |
|---|---|---|
| Ordinary Portland Cement | SLS 107 | Rs. 785/- |
| Portland Limestone Cement | SLS 1253 | Rs. 785/- |
| Masonry Cement | SLS 515 | Rs. 735/- |

මෙම නියෝගය 2011 නොවැම්බර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

සිමෙන්ති උපරිම මිල සම්බන්ධයෙන් 2010 මාර්තු මස 15 වැනි දින අංක 1645/6 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 12 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2011 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11-573